Sri Lanka Technology Campus
Non scholae set vitae discimus




# SLTC 2025 උපාධි ප්‍රදානෝත්සවය අතිසාර්ථකව අවසන් වෙයි





ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනයක් වන ශ්‍රී ලංකා තාක්ෂණ විශ්වවිද්‍යාලයේ (SLTC) වාර්ෂික උපාධි ප්‍රදානෝත්සවය 2025 දෙසැම්බර් (16) වන දින කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේ දී අති උත්කර්ෂවත් අන්දමින් පැවැත්විණි. තාක්ෂණික සහ නවෝත්පාදන කේන්ද්‍රීය උසස් අධ්‍යාපන ආයතනයක් වන SLTC සැසි දෙකකින් සමන්විත වූ මෙවර උපාධි ප්‍රදානෝත්සවයේ දී ඉංජිනේරු, ව්‍යාපාර කළමනාකරණ, පරිගණක හා තොරතුරු තාක්ෂණ, විද්‍යා, තාක්‍ෂණ සහ සංගීත යන අධ්‍යාපනික ක්ෂේත්‍ර ඔස්සේ උපාධි හා ඉංජිනේරු ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි පිරිනමන ලදී.

2025 වසරේ SLTC උපාධි ප්‍රදානෝත්සවය, එම විශ්වවිද්‍යාලයේ පළමු දශකය සම්පූර්ණ වීම සැමරීමට සමගාමී ව පැවැත්වීම විශේෂත්වයක් වූ අතර, එම ආයතනය පසුගිය වසර දහය තුළ, පර්යේෂණ හා නවතම තාක්‍ෂණය පදනම් කරගත් අධ්‍යාපනයක් හරහා වෙනස් වන ලෝකයේ රැකියා වෙළෙඳපොළ අවශ්‍යතාවලට සරිලන උපාධිධාරීන් නිර්මාණය කිරීම වෙත විශේෂ අවධානය යොමු කරමින් ක්‍රියාත්මක වූ බව සිහිපත් කළ යුතු ම ය.

උපාධි ප්‍රදානෝත්සවයක දී අනුගමනය කළ යුතු සාම්ප්‍රදායික පිළිවෙත්වලට මූලිකත්වය ලබා දෙමින් ආරම්භ වූ මෙවර උපාධි ප්‍රදානෝත්සවයේ උදෑසන සැසියේ දී ඉංජිනේරු පීඨයේ සහ ව්‍යාපාර කළමනාකරණ පීඨයේ උපාධිධාරීන් වෙත උපාධි පිරිනැමීම සිදු කෙරුණු අතර, සිය ප්‍රඥාව, දැනුම සහ අධ්‍යනය යන සංකල්ප ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් SLTC හි කැපවීම මෙවර උත්සවය හරහා පිළිබිඹු විය.

මෙවර උපාධි ප්‍රදානෝත්සවයේ පිළිගැනීමේ කතාව ශ්‍රී ලංකා තාක්ෂණ විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය චන්ද්‍රිකා එන්. විජයරත්න මහත්මිය විසින් පවත්වනු ලැබූ අතර, එහි දී උපාධිධාරීන්ගේ කැපවීම හා නොපසුබට උත්සාහය පිළිබඳව සුබ පැතුම් එක් කළ උපකුලපති තුමිය, නව ලොවට සරිලන උපාධිධාරීන් තැනීමට SLTC හි කැපවීම පිළිබඳ ව අවධාරණය කළා ය. උත්සවයේ උදෑසන සැසියේ දී ප්‍රධාන දේශනය, ස්වාධීන ආර්ථික විද්‍යාඥ හා ලංකා වාණිජ මණ්ඩලයේ හිටපු ප්‍රධාන විධායක නිලධාරී මංජුල ද සිල්වා මහතා විසින් පවත්වන ලද අතර, එහි දී ශ්‍රම බලකායට එක් වන වෘත්තිකයන් නවෝත්පාදනය, තර්කානුකූල චින්තනය සහ වගකීම් සහගත නායකත්වය යන සුවිශේෂී ගුණාංග ගොඩනංවා ගත යුතු බව සිල්වා මහතා අවධාරණය කළේය.

එමෙන් ම වැඩි දුර අදහස් දැක්වූ ඒ මහතා, අඛණ්ඩ අධ්‍යනයේ නිරත වන අතරතුර සිය වෘත්තීය වටිනාකම් ආරක්ෂා කර ගනිමින් ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයට ක්‍රියාකාරී දායකත්වය ලබා දීමට කැපවන ලෙස උපාධිධාරීන් දිරිමත් කළේය. ඉන් අනතුරුව උපාධිධාරීන්ගේ දේශනය සහ සදාචාරාත්මක හැසිරීම, වෘත්තීය භාවය හා සේවා නැඹුරු මානසිකත්වය වර්ධනය කරමින් උපාධි ප්‍රතිඥාව ඉදිරිපත් කිරීම සිදු කෙරුණු අතර, අදාළ උපාධි ප්‍රදානය කිරීමෙන් පසු ව උත්සවයේ වැඩ කටයුතු අවසන් විය.

2025 වසරේ SLTC උපාධි ප්‍රදානෝත්සවයේ දෙවන සැසිය, පරිගණක, විද්‍යා, තාක්ෂණ හා සංගීත යන අංශවලට අදාළ උපාධි හා ඉංජිනේරු ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි ප්‍රදානය කිරීම සිදු කෙරිණි. SLTC අධ්‍යයන රාමුවේ විශිෂ්ටත්වය සහ ශක්තිය අවධාරණය කරමින් උපකුලපතිනිය විසින් දෙවන සැසිය සඳහා ද පිළිගැනීමේ කතාව පවත්වනු ලැබූ අතර, අන්තර් විෂයානුකූල අධ්‍යාපනයේ වැදගත්කම සහ පවතින තත්ත්වයට අනුවර්තනය විය හැකි, පරිකල්පන ශක්තියෙන් අනූන මෙන් ම ගෝලීය වශයෙන් පවතින තරඟකාරිත්වයට මුහුණ දිය හැකි අයුරින් උපාධිධාරීන් සිය දැනුම හා කුසලතා වර්ධනය කර ගත යුතු බව ඇය එහි දී පැවසුවා ය. සන්ධ්‍යා සැසියේ ප්‍රධාන දේශනය කාර්මික තාක්ෂණ ආයතනයේ හිටපු අතිරේක පර්යේෂණ අධ්‍යක්ෂිකා ආචාර්ය ශාන්ති විල්සන් මහත්මිය විසින් පවත්වන ලද අතර, ශ්‍රී ලංකාවේ අනාගතය හැඩගැස්වීමේ දී පර්යේෂණ, නවෝත්පාදන සහ සාක්ෂි මත පදනම් වූ චින්තනයේ තීරණාත්මක කාර්යභාරය පිළිබඳ ව මෙන් ම දැනුම හඹා යාමේ දී නොපසුබට උත්සාහය සහ අභියෝගවලට සාර්ථක ව මුහුණ දීම සඳහා සිය විශේෂඥතාව භාවිත කිරීමේ වැදගත්කම පිළිබඳ ව ඇය අවධාරණය කළාය.

2025 උපාධි ප්‍රදානෝත්සවයේ ආරාධිතයකු ලෙස SLTC අධ්‍යක්ෂ මණ්ඩල සභාපති අජිත් ප්‍රනාන්දු මහතා සහභාගි වූ අතර, බහුවිධ කර්මාන්ත ක්ෂේත්‍ර ආශ්‍රිත අධ්‍යන අවස්ථා ලබා දෙන උසස් අධ්‍යාපන ආයතනයක් ලෙස SLTC ශක්තිමත් ස්ථාවරත්වයක් කරා රැගෙන යාමට ඒ මහතා සුවිශේෂී කාර්යභාරයක් ඉටු කළේය. සුබ පැතුම් පණිවුඩය නිකුත් කරමින් ඒ මහතා උපාධිධාරීන්ගේ කැප වීම අගය කළ අතර, අධ්‍යයන විශිෂ්ටත්වය, තාක්ෂණික නවෝත්පාදනය සහ පරිපූර්ණ ශිෂ්‍ය සංවර්ධනය පෝෂණය කිරීම සඳහා විශ්ව විද්‍යාලයේ දැක්ම පිළිබඳවද ඒ මහතා සිය පණිවුඩයේ සඳහන් කළේ ය. මෙවර උපාධි ප්‍රදානෝත්සවය මෙහෙයවීම SLTC උපකුලපති මහාචාර්ය චන්ද්‍රිකා එන්. විජයරත්න මහත්මිය විසින් සිදු කරනු ලැබූ අතර, ඇයගේ නායකත්වය සහ කැපවීම SLTC තුළ අධ්‍යයන ගුණාත්මකභාවය ඉහළ නැංවීම, පර්යේෂණ සංස්කෘතිය ප්‍රශස්ත කිරීම සහ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ වර්ධනය වෙනුවෙන් සුවිශේෂී කාර්යභාරයක් ඉටු කර ඇති බව සඳහන් කළ යුතු ම කරුණකි.

2025 SLTC උපාධි ප්‍රදානෝත්සවය, එම විශ්ව විද්‍යාලයේ දර්ශනය වන *Non Scholae Sed Vitae Discimus* යන තේමාව මුල් කර ගනිමින් ක්‍රියාත්මක කෙරුණු අතර, 2025 වසරේ උපාධි හිමි කර ගත් සිසු සිසුවියන්ට විශ්වවිද්‍යාලය මඟින් ලබා දුන් ශක්තිමත් අධ්‍යයන පදනම, විශ්ලේෂණ කුසලතා, නිර්මාණශීලිත්වය සහ විශ්වාසය සමඟ ඔවුන්ගේ වෘත්තීය ගමන් මඟ ආරම්භ කළ හැකි වීම ඔවුන්ට ලැබෙන සුවිශේෂී වරප්‍රසාදයකි.SLTC හි දශකය ගමන් මඟ දෙස ආපසු හැරී බලන විට, සිය ගෝලීය සහයෝගීතාවන් පුළුල් කිරීමට, පර්යේෂණ ධාරිතාව ශක්තිමත් කිරීමට, විශ්වවිද්‍යාල යටිතල පහසුකම් හා නේවාසික පහසුකම් වැඩි දියුණු කිරීමට සහ කර්මාන්ත ඒකාබද්ධතාව වර්ධනය කිරීමට නිරන්තරයෙන් කැප වී ඇති බව පැවසිය යුතු ම ය.










Sri Lanka Technology Campus

0117 999 000 info@sltc.ac.lk www.sltc.ac.lk